# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## පළමු වාර පරීක්ෂණය - 2019
## First Term Test - 2019

ගණිතය - I, II
Mathematics - I, II

කාලය පැය 1 ½

නම :- ............................................ විභාග අංකය :-


7 ශ්‍රේණිය

**I කොටස**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


(01) පෙට්ටියක බිත්තර 175 ක් තිබුණි. ඉන් බිත්තර 9 ක් බිඳී ඇත්නම් , ඉතිරි ගණන කීයද?

(02) රූපයේ සමමිතික අක්ෂ ගණන කීයද?



(03) **2576** යන සංඛ්‍යාවේ ඉලක්කම් දර්ශකය සොයන්න.

(04) අඳුරුකර ඇති කොටස රූපයෙන් කවර භාගයක් ද?



(05) **M = {"MAHARAGAMA"** යන වචනයේ අකුරු}
**M** කුලකය අවයව සහිතව ලියා දක්වන්න.

(අනෙක් පිටුව බලන්න.)

(06) **ප්‍රථමක සංඛ්‍යා යුගලක් <u>නොවන</u> පිළිතුරු යටින් ඉරක් අඳින්න.**

(i) (7,2)  (ii) (5,3)  (iii) (1,3)  (iv) (2,11)

---

(07) **$2^3$ හි පාදය හා දර්ශකය ලියා දක්වන්න.**

---

(08) **ක්‍රි.ව. 1815 වර්ෂය අයත් සියවස කුමක් ද?**

---

(09) **2400, 3222, 4152, 1245 යන සංඛ්‍යා අතරින් 6 න් සහ 9 න් යන සංඛ්‍යා දෙකෙන්ම ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යාව තෝරන්න.**

---

(10) $a \times a \times a \times b \times b$ **බලයන්ගේ ගුණිතයක් ලෙස දක්වන්න.**

---

(11) **සමාන්තර සරල රේඛා නිර්මාණයේ දී ඔබ භාවිතා කරන ගණිත උපකරණ දෙකක් ලියන්න.**

---

(12) **12 හි සියලු සාධක ලැබෙන පරිදි හිස්තැන් පුරවන්න.**

12 = 1 x 12

= .......... x ...........

= .......... x ...........

(අනෙක් පිටුව බලන්න.)

(13) පහත සඳහන් ප්‍රකාශන ඉදිරියේ නිවැරදි නම් ( ✓ ) ලකුණ ද වැරදිනම් ( x ) ලකුණ ද යොදන්න.

(a) වෘත්තාකාර ආස්තරයක සමමිතික අක්ෂ ගණන සමචතුරස්‍රයක අක්ෂ ගණනට සමානය. (..........)

(b) ද්වි පාර්ශවික සමමිතික රූපයක සමමිතික අක්ෂය දෙපස පිහිටි කොටස් දෙක වර්ගඵලයෙන් සමාන වේ. (..........)

---

(14) **32 ÷ 8 x 2** සුළු කරන්න

---

(15) අගය සොයන්න.

**3258 + 127 + 30**

---


(16) $\frac{3}{8} + \frac{1}{8}$ භාග සුළු කර සරලම ආකාරයෙන් දක්වන්න.

---

(17) **7,8,6,3** යන ඉලක්කම් හතරම යොදාගෙන **6** න් බෙදෙන විශාලම සංඛ්‍යාව තෝරන්න.

---

(18) සංඛ්‍යා රේඛාව භාවිතා කර කරන ලද සුළු කිරීමක් පහත දැක්වේ. හිස්තැන් පුරවන්න.




(+4) + ........... = ...................

---

(19) උතුරු දිශාවේ සිට දක්ෂිණාවර්තව මහා කෝණයක් සාදන දිශාව නම් කරන්න.

---

(20) යම් සංඛ්‍යාවක් **2,3** න් හා **4** න් බෙදූ විට **1** ක් ඉතිරි වේ. එම සංඛ්‍යාවට ගත හැකි කුඩාම අගය කීයද?

**(ලකුණු 2 x 20 = 40)**

**(අනෙක් පිටුව බලන්න.)**

## II කොටස

- ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01)


(i) **2, 0.5, 1.5, 4, 3, 2.75** සංඛ්‍යා කාණ්ඩ දෙකකට වෙන් කරන්න. එක් එක් කාණ්ඩය සඳහා නමක් දෙන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් සමූහ අතරින් කුලක තෝරා ලියන්න.

**a)** සිව්පා සතුන්      **b)** උස ළමයි

**c)** සංයුත සංඛ්‍යා      **d)** දක්ෂ ගායකයන් (ලකුණු 02)

(iii)





P කුලකය,

(a) අවයව සඟල වරහන් තුළ ලියන්න. (ලකුණු 02)

(b) නිශ්චිතව හඳුනාගත හැකි පොදු ලක්ෂණයක් මගින් ලියන්න. (ලකුණු 02)

(iv) D = {**1** ත් **10**ත් අතර ඉරට්ටේ සංඛ්‍යා}

D කුලකය සිසුවෙකු විසින් පහත පරිදි වෙන් සටහනක දක්වන ලදී.




(a) මෙහි සඳහන් දෝෂ දෙකක් ලියන්න. (ලකුණු 02)

(b) D කුලකය නිවැරදිව වෙන් සටහනක දක්වන්න. (ලකුණු 02)

---

(02)

(a)


(i) පහත වගුව සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යාව | සියලුම සාධක |
|---|---|
| **36** | |
| **24** | |

(ලකුණු 02)

(ii) **36** හා **24** යන සංඛ්‍යා දෙකටම පොදු සාධක ලියන්න. (ලකුණු 02)

(iii)




මෙහි දැක්වෙනුයේ දිග 36 cm ක් හා පළල 24 cm ක් වූ කඩදාසියකි. අපතේ යාමකින් තොරව එම සෘජු කෝණාස්‍රයෙන් කැපිය හැකි විශාලම සමචතුරස්‍රයක පැත්තක දිග සොයන්න. (ලකුණු 02)

(b) පියෙක් තමා සතු ඉඩමෙන් $\frac{1}{3}$ හා $\frac{1}{4}$ යන ප්‍රමාණ තම දරුවන් දෙදෙනාට බෙදා දෙන ලදී.


(i) ඉහත භාග අතරින් විශාල භාගය ලියන්න. (ලකුණු 02)

(ii) දරුවන් දෙදෙනාට දුන් කොටස මුළු ඉඩමෙන් කවර භාගයක්ද? (ලකුණු 02)

(iii) දැන් පියාට ඉතිරි කොටස ඉඩමෙන් කවර භාගයක් ද? (ලකුණු 02)

(අනෙක් පිටුව බලන්න.)

(03)




(i) මෙම රූප සටහන ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.


| කෝණය | කෝණ වර්ගයේ නම |
|---|---|
| $a$ | |
| b | |
| $c$ | |
| d | |

(ලකුණු 04)

(ii) පහත සඳහන් කෝණ වර්ගවලට උදාහරණය බැගින් ලියන්න.
(a) ගතික කෝණ ........................................
(b) ස්ථිතික කෝණ ........................................ (ලකුණු 02)

(iii)
(a) සරල රේඛාවක් ඇඳ එය **PQ** ලෙස නම් කරන්න. (ලකුණු 02)
(b) **PQ** සරල රේඛාවට සමාන්තරව සරල රේඛාවක් නිර්මාණය කර එය **RS** ලෙස නම් කරන්න. (ලකුණු 02)

(iv)




මෙම තල රූපයේ,

(a) සමාන්තර පාද යුගලක් නම් කරන්න. (ලකුණු 02)
(b) සමාන්තර නොවන පාද යුගලක් නම් කරන්න. (ලකුණු 02)

---

(04)

(i) ක්‍රි.ව. 2019 අයත්වන දශකය කුමක්ද? (ලකුණු 02)

(ii) 19 වන සියවසේ ආරම්භක වර්ෂය හා අවසාන වර්ෂය ලියන්න. (ලකුණු 02)

(iii) ක්‍රි.ව. 1800 අධික අවුරුද්දක් බව මනුක පවසයි. ඔහුගේ ප්‍රකාශය සත්‍ය ද? අසත්‍ය ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 02)

(iv) සුළු කරන්න.

(a)

| | පැය | මිනිත්තු | තත් |
|---|---|---|---|
| | 2 | 15 | 32 |
| + | 1 | 46 | 35 |

(ලකුණු 03)

(b)

| | අවු | මාස | දින |
|---|---|---|---|
| | 2020 | 02 | 01 |
| - | 2015 | 01 | 21 |

(ලකුණු 03)

(අනෙක් පිටුව බලන්න.)

(05)

(i) 81, 3 හි බලයක් ලෙස ලියන්න. (ලකුණු 02)

(ii) පාදය 2 හා දර්ශකය 5 වන බලය ලියන්න. (ලකුණු 02)

(iii) ඉහත බලය විහිදුවා ලියා අගය සොයන්න. (ලකුණු 02)

(iv) 36 ප්‍රථමක සංඛ්‍යාවල බලවල ගුණිතයක් ලෙස ලියන්න. (ලකුණු 02)

(v) P = 2 හා q = 3 නම් පහත ප්‍රකාශනවල අගය සොයන්න.

a) $2P^3q^2$ b) $P^2q$

(ලකුණු 04)

---

(06)

(i) 24 ÷ 2 ( 7 - 3 ) සුළු කරන්න. (ලකුණු 03)

(ii) විදුලි බිල සකස් කිරීමේ දී පළමු ඒකක 100 සඳහා ඒකකයකට රු. 5.00 බැගින් ද වැඩිවන සෑම ඒකකයක් සඳහාම රු. 8.00 බැගින් ද අය කරයි. එක්තරා නිවසක් මසක් තුළදී විදුලි ඒකක 112ක් වැය කර ඇත් නම්, එම නිවසේ මාසික විදුලි බිල සකස් කිරීම සඳහා,

(a) සංඛ්‍යාත්මක ප්‍රකාශනයක් ලියන්න. (ලකුණු 02)

(b) එම ප්‍රකාශනය සුළු කරන්න. (ලකුණු 02)

(iii) අගය සොයන්න.
(-2) + (-5) (ලකුණු 02)

(iv) එංගලන්තයේ එක්තරා නගරයක, යම් දිනක පෙ.ව. 5.00ට උෂ්ණත්වය -4.0 $^{o}$C විය. ප.ව. 2.00 වන විට එහි උෂ්ණත්වය 13$^{o}$C කින් වැඩිවිය. නගරයේ නව උෂ්ණත්වය සොයන්න.

(ලකුණු 03)

MATHS PAPERS.INFO



ඔබට අවශ්‍ය සියලුම ගණිත ප්‍රශ්න පත්‍ර ( mathspapers.info ) වෙතින් පහසුවෙන්ම ලබාගන්න